# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2079/79 - 2018 ජූලි මස 13 වැනි සිකුරාදා - 2018.07.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වන වගන්තතිය යටතේ දැන්වීමයි

*මගේ අංකය*: ඉ/4/8/නාකලගමුව/ගොඩාකුරුව.

*ඉඩම් අමාත්‍යාංශ යොමු අංකය*: 4/3/7/2017/HW/439.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් අත්කර ගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*අත්කර ගැනීමට නියමිත ඉඩම් විස්තර* :

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, නාරම්මල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1054 ගොඩාකුරුව සහ අංක 1059 නාකලගමුව ග්‍රාම නිලධාරි කොට්ඨාසවල, මැදගමුව, ගොඩාකුරුව සහ නාකලගමුව ගම්වල පිහිටි, සර්වේ ජනරාල් වෙනුවට කුරුණෑගල දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් පිළියෙල කරන ලද මූලික පිඹුරු අංක කු.2350 හා 2016. 12. 30 දිනැති සිතියමේ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.4207 ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබලි 19, 20, 21, 22, 26, 27 (කැබලි 6)ක්.

01. **කැබලි අංක 19**

ඉඩමේ නම: වංගෙඩිකැල්ල *හෙවත්* ගලගාවවත්ත; විස්තරය: ගෙවත්ත සහ මිශ්‍ර වගාවක් ඇත; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් පාන්නා: නාරම්මල, මැදගමුව පදිංචි මායාදුන්නගේ ගුණරත්න, නාරම්මල, මැදගමුව පදිංචි පීරිස්ගේ එමලින් නෝනා, නාරම්මල, මැදගමුව, ගිරානකන්ද පදිංචි රාජපක්ෂ ජේඩි දූරයලාගේ විජේරත්න සහ තවත් අය; ප්‍රමාණය: හෙක්. 0.0120.

02. **කැබලි අංක 20**

ඉඩමේ නම: පිටවලවත්ත; විස්තරය: ගෙවත්ත සහ මිශ්‍ර වගාවක් ඇත; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් පාන්නා: නාරම්මල, මැදගමුව, පිටවලවත්ත පදිංචි හොරතල් ජේඩි දූරයලාගේ මැණිකා; ප්‍රමාණය: හෙක්. 0.0106.

03. **කැබලි අංක 21**

ඉඩමේ නම: පිටවලවත්ත; විස්තරය: ගෙවත්ත සහ මිශ්‍ර වගාවක් ඇත; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් පාන්නා: නාරම්මල, මැදගමුව, පිටවලවත්ත, අංක 17 පදිංචි රංකිරාලාගේ යසපාල *නොහොත්* පොඩියා; ප්‍රමාණය: හෙක්. 0.0052.

04. **කැබලි අංක 22**

ඉඩමේ නම: පිටවලවත්ත; විස්තරය: ගෙවත්ත සහ මිශ්‍ර වගාවක්, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක්, ළිඳක් සහ වතුර වළක් ඇත; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් පාන්නා: නාරම්මල, මැදගමුව, පිටවලවත්ත පදිංචි හොරතල් ජේඩි දූරයලාගේ මැණිකා; ප්‍රමාණය: හෙක්. 0.3222.




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

05. **කැබලි අංක 26**

ඉඩමේ නම: පිටවලවත්ත; විස්තරය: කුඹුර; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් පාන්නා: නාරම්මල, මැදගමුව, පිටවලවත්ත පදිංචි හොරතල් පේඩි දූරයලාගේ මැණිකා; ප්‍රමාණය: හෙක්. 0.0503.

06. **කැබලි අංක 27**

ඉඩමේ නම: පිටවලවත්ත; විස්තරය: ගෙවත්ත සහ මිශ්‍ර වගාවක් සහ ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් පාන්නා: නාරම්මල, මැදගමුව, පිටවලවත්ත පදිංචි හොරතල් පේඩි දූරයලාගේ මැණිකා; ප්‍රමාණය: හෙක්. 0.0204.

ඉහත ඉඩම් කැබලි සඳහා අයිතිවාසිකම් කියන සියලු දෙනාම *ගැසට් පත්‍රයේ* නම සඳහන් වී ඇතත් නැතත් එම ඉඩම් සම්බන්ධයෙන් තමන්ට ඇති අයිතිවාසිකම් පරවශතාවයන් එක් එක් බිම් කැබැල්ල වෙනුවෙන් වෙන වෙනම, පිටපත් දෙකකින් යුත් ලියවිල්ලකින් එම ඉඩම්වලට ඇති ස්වකීය අයිතියේ ස්වභාවය, එම ඉඩම් කැබලි සඳහා තමන්ට ඉදිරිපත් කළහැකි කරුණු පිළිබඳ විස්තරයක් 2018.08.06 වැනි දින මගේ කාර්යාලයේ දී මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඒ අනුව 2018.08.13 වැනි දින සිට මා විසින් විධිමත් ලිපියක් නියෝජිතයකු මගින් දැනුම් දෙනු ලබන දිනයක දී තමන් විසින්ම නැතහොත් තමන් විසින් ලිඛිතව බලය පවරනු ලබන නියෝජිතයෙකු නියමිත දින, නියමිත වෙලාවට අදාළ ඔප්පු හා මා විසින් නියම කරනු ලබන අනිකුත් ලියකියවිලි සමග නාරම්මල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී හිමිකම් පරීක්ෂණය සඳහා ඉදිරිපත් වියයුතු ය. පරීක්ෂණය සඳහා නියෝජිතයෙකු ඉදිරිපත් කරන්නේ නම් ඉඩම් හිමිකම් කියන්නා විසින් බලය පවරනු ලබන ලිපියක් නොමැතිව ප්‍රකාශ හෝ සාක්ෂි සටහන් නොකරගනු ලබන බව අවධාරණය කරමි.

එස්. එම්. පෙත්තාවඩු,
ප්‍රාදේශීය ලේකම් හා ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි,
නාරම්මල.

2018 ජූලි මස 09 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
නාරම්මල.

07 - 961

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.